ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2017 සැප්තැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 செப்டம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, September 2017

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්ණය ඇතුලු සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

කැළණි ගඟ අසබඩ අවන්හලක් පවත්වාගෙන ගිය ගංගනාත් විජයසූරිය ඔහුගේ ව්‍යාපාරය පසුගිය දා ඇති වූ ගංවතුර හේතුවෙන් විනාශයට පත් විය. ගං වතුර බැස යාමෙන් පසු ජුනි මාසයේ ව්‍යාපාරයේ නමින් ඔහු කොළොන්නාව මහජන බැංකුවේ ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ 6% වාර්ෂික පොලියට රු. 400,000 ක ණය මුදලක් ලබා ගත්හ. ඔහු ලග ඉතිරිකර ගත් රු. 200,000 මුදල් ද යොදවමින් නැවත ඔහුගේ ව්‍යාපාරය නව මුහුණුවරකින් "ගංගනාත් අවන්හල" නමින් ආරම්භ කිරීම සඳහා සැලසුම් සකස් කරමින් සිටින අතර තුර දී දේශීය විදේශීය ආහාර වර්ග පිසීමේ පුහුණු පාඨමාලාවක් හදාරා ඇති ඔහුගේ මිතුරෙකු වූ රංගනාත් සමරසේකර ද රු. 300,000 මුදලක් ව්‍යාපාරයට යොදවමින් එක් විය. දෙදෙනාම එකතුවීමෙන් පසු මෙම අවන්හල එම ප්‍රදේශයේ ම ඉඩ පහසුකම් සහිත මාසික කුලිය රු. 50,000කට, වෙනත් ස්ථානයක පිහිටි ගොඩනැගිල්ලකට ගෙන ගියහ. ආහාර පිසීම සඳහා රු. 90.000 උපකරණ ණයට ලබා ගන්නා ලදි. පසුව එම වර්ෂයේ ජුනි මස දැරූ වියදම් සාරාංශයක් පහත දැක්වේ.

| | |
|---|---|
| අත්පිට ගැණුම් | රු. 340,000 |
| අනෙකුත් ද්‍රව්‍ය සඳහා ගෙවීම් (භාවිතය සඳහා) | රු. 120,000 |
| මාසික විදුලි බිල | රු. 15,000 |
| මාසික ගොඩනැගිලි කුලිය | රු. 50,000 |
| අත් උදව්කරුට ගෙවූ මාසික වැටුප | රු. 40,000 |

- ❖ ආහාර පිසීම සඳහා ලබා ගත් උපකරණ වල ඵලදායි ජිවිත කාලය වසර 10 කි.
- ❖ ණය පොලිය, මාසික වාරිකය ගෙවන ලදි.

(i) අ. නව ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධානය කුමක් ද?
ආ. එම ව්‍යාපාර සංවිධානයේ වාසි හා අවසිය බැගින් ලියන්න.

(ii) අ. ගංගනාත් හා රංගනාත් ආරම්භ කළ ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද?
ආ. ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(iii) නව ව්‍යාපාරයේ ශක්තියක් හා අවස්ථාවක් නම් කරන්න.

(iv) ගංගනාත් හා රංගනාත්ගේ ව්‍යාපාරයේ සඳහා බඳවා ගත හැකි උපරිම සංඛ්‍යාව කීය ද? ඒ බව සඳහන් කර ඇති පණත කුමක් ද?

(v) මෙම ව්‍යාපාරය පිළියෙල කල යුතු උපයෝගි පොත් 2ක් සඳහන් කරන්න.

(vi) මෙම ව්‍යාපාරයේ ජුනි 01 දිනට මුළු වත්කම් වල වටිනාකම කොපමණද ?

(vii) ලබා ගත් බැංකු ණය මුදල සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න.

(viii) මෙම ව්‍යාපාරයේ ජුනි 30 දිනට වගකීම් කියද ?

(ix) මෙම ව්‍යාපාරයේ ජුනි මාසය අවසාන දිනට මුළු වියදම කීය ද?

(x) මෙම ව්‍යාපාරයේ ජුනි මාසයේ මුදල් ගිණුම සකස් කර මාසය අවසනයේ ශේෂය ගණනය කරන්න.

*(ලකුණු 02 x 10 = 20 යි)*

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

02. i. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් හදුනාගත් ව්‍යාපාරික ශක්තියක් හා බාහිර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් හඳුනාගත් තර්ජනයක් නම් කරන්න.

ii. ව්‍යාපාර අරමුණු ඉටුකර ගැනීමේ දී ව්‍යාපාරයකට ඇතිවිය හැකි විවිධ ඉලක්කයන් හෙවත් උප අරමුණු 2ක් නම් කරන්න.

iii. පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

- ❖ අවශ්‍යතා හා වුවමනා, ව්‍යාපාර බිහිවීමට ප්‍රධාන පදනම වී ඇත.
- ❖ ජාත්‍යන්තර වෙළෙඳ සම්බාධක පැනවීම ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයෙන් ලැබෙන තර්ජනයකි.
- ❖ දේශීය පුහුණු ශ්‍රමය විදේශ රටවලට ඇදී යාම, ගෝලීය පරිසරයෙන් දේශීය ව්‍යාපාර සඳහා හිතකර ලෙස බලපායි.
- ❖ ව්‍යාපාර කටුයුතු සදහා උනන්දුවක් දක්වන විවිධ පාර්ශව ඇල්මැති පාර්ශව ලෙස හඳුන්වයි.

iv. යුරෝපා සංගමය, ජපානය, බ්‍රිතාන්‍ය හා ඇමරිකාව වැනි රටවල් හා සංවිධාන භාවිත කරන මුදල් වර්ග නම් කරන්න.

*(ලකුණු 08)*

03. i. "සෑම ව්‍යාපාරයකම මූලික අරමුණ ලාභ ලැබීම ය." ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේ ද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

ii. අ. හවුල් ගිවිසුමක් ඇති කර ගත හැකි ක්‍රම මොනවාද ?

ආ. වංචා වැළැක්වීමේ ආඥා පනතේ හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇත්තේ කුමක්ද?

iii. පහත සදහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

- ❖ අතිරික්තය සාමාජිකයින් අතර පෞද්ගලිකව බෙදීම සමූපකාර සමිතියක ලක්ෂණයක් නොවේ.
- ❖ "කළණ සහ පුත්‍රයෝ" හවුල් ව්‍යාපාරයකට නිදසුනක් වේ.
- ❖ රාජ්‍ය දෙපාර්තමේන්තු පාර්ලිමේන්තුවේ හා අදාල අමාත්‍යාංශයේ සෘජු පාලනයට යටත් වේ.
- ❖ ඒක පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කර දින 21ක් ඇතුළත ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමට අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

iv. අ. රාජ්‍ය සංස්ථා ආරම්භ කෙරෙන ක්‍රම මොනවා ද ?

ආ. රාජ්‍ය සංස්ථා හඳුනාගත හැකි තවත් නම් 4ක් ලියන්න.

*(ලකුණු 08)*

## II **කොටස - ගිණුම්කරණය**

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

04. පහත දැක්වෙන්නේ සයුරිගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයේ සිදුවූ ගනුදෙනු කිහිපයකි. ඒ ඇසුරෙන් බැංකු ගිණුම, මුදල් පොත හා ලෙජර් ගිණුම් පෙන්වන්න. (ලෙජර් ගිණුම් තුලනය කිරීමට ද ලකුණු ප්‍රදානය කරනු ලැබේ.)

01/01 මුදල් ශේෂය රු. 20,000
බැංකු ශේෂය රු. 12,700
ණයගැති ශේෂය රු. 19,200
ණයහිමි ශේෂය රු. 15,000
01/03 බැංකුවේ තැන්පත් කලා රු. 5,000
01/08 ණයගැතියකුගෙන් චෙක්පතක් ලැබුණා රු. 8,200
01/10 රු. 8,200 චෙක්පත බැංකුවේ තැන්පත් කළා.
01/13 රු. 9,000ක් බැංකුවෙන් ආපසු ගත්තා
01/17 අත්පිට විකුණුම් රු. 18,000 යි.
01/20 ණයහිමියන්ට ගෙව්වා රු. 6,700 වට්ටම රු. 300
01/22 විදුලි බිල චෙක්පතකින් ගෙව්වා රු. 4,200
01/24 ණයගැතියකුගෙන් චෙක්පතක් ලැබුණා රු. 3,900 (වට්ටම රු 100)
01/25 බැංකුවෙන් මුදල් ගත්තා රු. 3,600
01/26 අත්පිට විකුණුම් රු. 12,000 එය එදිනම බැංකු ගත කලා
01/28 ණයහිමියකුට ගෙව්වා චෙක්පතකින් රු. 7,700 (වට්ටම රු. 300)
01/30 ණයගැතියකුගෙන් චෙක්පතක් ලැබුණා. එය එදිනම බැංකු ගත කලා රු. 6,600 වට්ටම රු. 400

*(ලකුණු 12)*

05. අ. පහත දැක්වෙන ගනුදෙනු ගිණුම් සමීකරණයට බලපාන ආකාරය දක්වන්න. (පිළිතුරු සැපයීමේ දී පහත දැක්වෙන ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න.)

1. අයිතිකරු ප්‍රාග්ධනය යෙදීම රු. 150,000
2. යන්ත්‍රයක් මිලට ගැනීම රු. 45,000
3. බැංකු ණයක් ලබා ගැනීම රු. 60,000
4. ගොඩනැගිලි මාසික කුලිය ගෙවීම රු. 10,000
5. ණයගැතියන්ගෙන් මුදල් ලැබීම රු. 8,000

| | ගනුදෙනුව | වත්කම් | = | අයිතිකරුගේ හිමිකම (ප්‍රාග්ධනය) | + | වගකීම් |
|---|---|---|---|---|---|---|
| උදා :- | 1. | මුදල් +150,000 | | ප්‍රාග්ධනය +150,000 | | |
| | 2 | | | | | |
| | 3 | | | | | |
| | 4 | | | | | |
| | 5 | | | | | |

*(ලකුණු 4)*

ආ. සාරංගගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයේ සිදුවු සුළු වියදම් පිලිබඳ විස්තර පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ජනවාරි | 01 | ඉදිරියට ගෙ ආ සුළු මුදල් ශේෂය | රු. 150 |
| | 01 | අග්‍රිමය ප්‍රතිපූරණය කළා | රු. 850 |

**මාසය තුළ කල වියදම්**

| | | | |
|---|---|---|---|
| ජනවාරි | 04 | මුද්දර ගත්තා | රු 150 |
| | 08 | ගමන් ගාස්තු | රු. 80 |
| | 10 | විදුලි පණිවිඩ ගාස්තු | රු. 40 |
| | 15 | ලියුම් කවර | රු. 75 |
| | 17 | බස් ගාස්තු | රු. 40 |
| | 20 | වැටුප් අත්තිකාරම් | රු. 175 |
| | 24 | සංග්‍රහ වියදම් දැරුවා | රු. 75 |
| | 27 | රාක්කයක් ගත්තා | රු. 125 |
| | 30 | විවිධ වියදම් | රු. 85 |

තැපල්, ගමන් හා විවිධ යන විශ්ලේෂණ තීරු සහිත අග්‍රිම ක්‍රමයේ සුළු මුදල් පොතක් පිළියෙළ කර පෙබරවාරි 01 දිනට අග්‍රිමය ප්‍රතිපූරණය කරන්න.

*(ලකුණු 8)*

*(ලකුණු 12)*

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.